# 5 පහේ පන්තිය

01) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

අප රිංගූ ගඟ අද්දර කැලේ එක පැත්තක අහස අල්ලන්ට මෙන් ඉහළ නඟින්නේ කඳු ගැටයක් නිසා ය. ඒ කඳු ගැටය මුදුනේ දැවැන්ත කළු ගලක් ඇත. එය අපේ ගම දෙස බලා සිටින අද්භූත මිනිසකු වැන්න. කුඩා කල මේ ගල් පර්වතය අප සිත බියෙන් තැති ගැන්වීය. හැන්දෑවට මේ ගල මුදුනට මලානික අව් රැල්ලක් වැටෙයි. එය රාස්සිගේ අව්ව යයි වැඩිහිටියෝ කීහ. රාස්සි ඒ ගල මත්තෙහි වී වනා වේළන්නේ ඒ වෙලාවට යයි ඔවුහු අපට කියා දුන්හ. ඒ නිසා අප කඳු මුදුන දෙස වැඩිපුර බැලුවේ නැත. වැරදිලාවත් බැලුවේ නම් අප තුළ ඇති වූයේ රාස්සිය දුටුවා හා සමාන තැති ගැන්මකි.

ගඟ අද්දර කැලේ - සෝමවීර සේනානායක

1. කඳු ගැටය මුදුනේ තිබෙන්නේ කුමක් ද?

.......................................................................................................................

2. හැන්දෑවට ගල මුදුනට වැටෙන අව්රැල්ල වැඩිහිටියන් හඳුන්වන්නේ කුමන නමකින් ද?

.......................................................................................................................

3. විශාල යන පදය වෙනුවට ඡේදයේ ඇති පදය කුමක් ද? ..............................................................

4. ඔවුහු අපට කියා දුන්හ. මෙම වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

.......................................................................................................................

PAPERMASTER.LK

5. අප යන පදයෙහි උක්ත පදය ලියන්න. ..........................................................................................

6. මෙහි ඇති උපමාවක් තෝරා ලියන්න. ..........................................................................................

..........................................................................................................................................

02) පහත දැක්වෙන එක් එක් වාක්‍ය ඛණ්ඩය සඳහා අර්ථයෙන් සමාන තනි පදය ඉදිරියෙන් ලියන්න.

1. නැව් නවත්වන ස්ථානය - ..............................................................

2. පාද හතරක් ඇති - ..............................................................

3. රාත්‍රී කාලයේ හැසිරෙන - ..............................................................

03) පහත ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. පරංගියා .............................................. ගියා වගෙයි.

2. .............................. හිටවපු ඉන්න වගේ.

3 . ....................................................... නූලයි වගේ.

04) පහත වචනවලට විරුද්ධ පද ලියන්න.

1. ආරම්භය - ..........................................................................................

2. අයහපත් - ..........................................................................................

3. සුදුසු - ..........................................................................................

05) පහත සඳහන් වැකිය බහුවචනයට හරවා ලියන්න.

1. ගස සුළඟට සෙලවෙයි.

..........................................................................................................................................

2. ළමයා පාසලට යයි.

..........................................................................................................................................

PAPERMASTER.LK

06) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

1. ගුරුතුමිය පන්තියට එයි.

.............................................................................................................................................

2. ගොවියෝ කුඹුරු කොටති.

.............................................................................................................................................

3. ළමයා පාසලට යයි.

.............................................................................................................................................

07) ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. වේදනාවක් ගෙන දෙයි. ....................................................................... ( වනය / වණය )

2. ජලය ගලාගෙන යයි. ....................................................................... ( ඇල / ඇළ )

08) සුදුසු පරිදි විරාම ලකුණු යොදා නැවත ලියන්න.

1. පුතේ පාඩම් කරන්න .............................................................................................................

2. ඒ කතාව මොකක් ද .............................................................................................................

PAPERMASTER.LK